සියලු ම හිමිකම් ඇවිරිණි.
*All Right Reserved*



'බෝවිටියා මල් යාය' ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2026

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## නිපුණතා සංවර්ධන පෙරහුරුව - අංක 03



**5 ශ්‍රේණිය**

# I පත්‍රය

කාලය:- පැය එකයි.

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස්


ඔබේ නම මෙම කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

නම :- ..........................................................................

- මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන තිළිණයකි.


- **අංක 1 සිට 2 ප්‍රශ්නවලට මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.**


1) 


(1) 


(2) 

(3) 

2) 


(1) 


(2) 


(3) 


- **අංක 3 හා 4 ප්‍රශ්නවල දී ඇති වචන යුගලයට වඩාත් ගැළපෙන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**

3) ස්වාභාවික සෙවන



(1)




(2)




(3)


4) ප්‍රාණවත් අලංකාර



(1)



(2)




(3)

5) පහත වාක්‍ය අතරින් වඩාත් නිවැරදි ව අර්ථය ප්‍රකාශ කරන වාක්‍යය තෝරන්න.

(1) උද්දාමයට පත් නරඹන්නන්ට ජයග්‍රාහකයෝ අත්පොළසන් දුන්හ.

(2) ජයග්‍රහණයෙන් උද්දාමයට පත් නරඹන්නෝ සතුටින් අත්පොළසන් දුන්හ.


(3) නරඹන්නන් සහ ජයග්‍රාහකයන් සතුටින් උද්දාමයට පත්ව අත්පොළසන් දුන්හ.

6) 


මෙහි දැක්වෙන කෝටුවකින් අඳින ලද බිම් සැලැස්මෙහි එක් රේඛාවක් මත දෙවරක් ගමන් නොකරන පරිදි මෙහි සෑම රේඛාවක් මත ම ඇවිද යාමට රජිතට අවශ්‍යව ඇත. ඒ සඳහා ඔහු ගමන ආරම්භ කළ යුත්තේ කුමන ස්ථානයෙන් ද?


(1) B (2) F (3) C


7) හිස්තැනට ආ යුතු නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.




(1) 10 (2) 12 (3) 14

8)







(1) (2) (3)

9) වසරේ සෑම 29 යෙදෙන දිනක ම චිතුලිගේ මව බෝධි පූජාවක් පවත්වයි. ඒ අනුව ඇය 2020 හා 2021 යන වර්ෂවල පවත්වා ඇති බෝධි පූජා ගණන කීය ද?

(1) 12 (2) 24 (3) 23

10) පහත රූපයේ දැකිය හැකි ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 10 (2) 11 (3) 12

11) ළමයෙකුට ඉදිරියෙන් තවත් ළමයින් දෙදෙනෙකි. ළමයෙකුට පිටුපසින් තවත් ළමයින් දෙදෙනෙකි. මෙහි සිටිය හැකි අවම ළමයින් ගණන කීය ද?

(1) 5 (2) 6 (3) 3

- **දී ඇති සටහන අනුව 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

12)

| | | | | |
|---|---|---|---|---|
| A | B | C | A | 22 |
| D | C | D | E | 11 |
| 8 | 12 | 7 | 6 | |

C x A =

(1) 20 (2) 15 (3) 18

13) දෙපස අගය නිවැරදි පිළිතුරු තෝරන්න.

(1) A+D+E = CxA-B
(2) B ÷ C+B = B+A-D
(3) ExB+D = B+E+C

14) නිමල් උපදින විට ඔහුගේ මවගේ වයස අවුරුදු 25 කි. නිමල්ගේ මල්ලී උපදින විට අම්මාගේ වයස අවුරුදු 29 කි. නිමල්ගේ දැන් වයස අවුරුදු 10 ක් නම් මල්ලීගේ දැන් වයස කීය ද?

(1) අවුරුදු 10 (2) අවුරුදු 4 (3) අවුරුදු 6

15) නිමල් එක්තරා මුදලකින් රු. 10.00 ක් දී මකනයක් ගත්විට ඉතිරි මුදලෙන් $\frac{1}{4}$ රු. 60 ක් බව නිමල් කීවේ ය. මකනය ගැනීමට පෙර තිබූ මුළු මුදල විය හැක්කේ,

(1) රු. 240.00 කි.

(2) රු. 250.00 කි.

(3) රු. 300.00 කි.

- **අංක 17 හා 18 සඳහා දී ඇති ප්‍රශ්නවලට ඒවායින් තුනක් එක් කාණ්ඩයකටත් දෙකක් තවත් කාණ්ඩයකටත් කාණ්ඩ කළ හැකි ය. එම කාණ්ඩ දෙකෙන් එක් කාණ්ඩයකටවත් අයත් නොවන දෙය කුමක් ද?**


16) කැවුම්, වැලිතලප, ගෝවා, අග්ගලා, රතුළූණු, බණ්ඩක්කා

(1) අග්ගලා (2) ගෝවා (3) රතුළූණු


17) ගැටබෙරය, තම්මැට්ටම, නගුල, දවුල, උදැල්ල, කිණිහිරය

(1) කිණිහිරය (2) දවුල (3) තම්මැට්ටම


18) වචනවලට වඩාත් ම ගැළපෙන රූපය තෝරන්න.
(දිය ගොඩ උභයජීවී)



(1)



(2)




(3)

19) සමචතුරස්‍රාකාර ඉඩමක් වටේ සිටුවා ඇති කණු ගණන 24 කි. එහි පැති දෙකක සිටුවා ඇති කණු සම්පූර්ණයෙන් ම ගලවා ඉවත් කර ඇත. ඒ අනුව මෙහි ඉතුරුවිය හැකි අවම කණු ගණන කීය ද?

(1) 11 (2) 10 (3) 12

20) රූපයේ ඇති භාජනයේ $\frac{1}{4}$ ජලයෙන් පුරවන විට එම ප්‍රමාණයෙන් $\frac{1}{4}$ ක් එහි ඇති සිදුරකින් ඉවතට ගලා යයි. එහි සිදුර නොතිබුණේ නම් එහි $\frac{1}{4}$ ක් පිරීමට ගතවන කාලය මිනිත්තු 8 කි. ඒ අනුව භාජනය සම්පූර්ණයෙන් පිරීමට ගතවන කාලය කොපමණ ද?



(1) මිනිත්තු 32

(2) මිනිත්තු 48

(3) මිනිත්තු 40

21) කිසියම් ඉලක්කම් හතරේ සංඛ්‍යාවක් සෑදීමට ඉලක්කම් යොදා ගනු ලැබුවේ පහත ආකාරයේ රටාවකට ය.

- මුල් ඉලක්කම දෙවන ඉලක්කමෙන් බාගයකි.
- දෙවන ඉලක්කම මෙන් දෙගුණයක අගයක් තුන්වන ඉලක්කමේ ඇත.
- තුන්වන ඉලක්කමේ අගය හතරවන ඉලක්කමේ අගයෙන් බාගයකි.

ඒ අනුව ඉහත සංඛ්‍යාව ගොඩනැගීමට යොදාගත හැකි ඉලක්කම ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) 8, 2, 1, 4 (2) 2, 6, 3, 1 (3) 8, 6, 4, 2

22) ශාලාවක කිසියම් ළමයින් පිරිසක් සිටිති. එයට දෙදෙනෙකු ඇතුළු වූ පසු සිව්දෙනෙකු ශාලාවෙන් පිට වී යයි. මෙලෙස වාර 3 ක දී ශාලාවෙන් සිසුන් පිට වූ විට ශාලාවේ කිසිවෙක් ඉතිරි නොවීය. ඒ අනුව ශාලාවේ මුලින් ම සිටි ළමයි ගණන කීය ද?

(1) 6 (2) 4 (3) 8

23) සුපුන්ගේ නංගී ශීලා ය. ශීලා සමන්ට වඩා උස ය. සමන්ගේ අක්කා රාධා ය. රාධා සුපුන්ට වඩා උසින් අඩු ය. ශීලාගේ අයියා විසල් ය. ඔහු සුපුන්ට වඩා උසින් වැඩි ය. ඒ අනුව උසින් වැඩි ම අය හා ඔවුන් අතර සම්බන්ධය වඩාත් නිවැරදි ව දක්වා ඇති පිළිතුර කුමක් ද?

(1) විසල් - එකම පවුලේ සහෝදර සහෝදරියක් වේ.

(2) සුපුන් - විවිධ උසින් යුතු පිරිසකි.

(3) විසල් - සහෝදර සහෝදරියන් හා මිතුරන් පිරිසකි.


24) එක්තරා කණ්ඩායමක සිසුන් 5 ක් සිටිති. ඔවුන්ට පැන්සල් 20 ක් බෙදා දීමට තිබේ. කිසිදු සිසුවෙකුට පැන්සල් 2 ට වඩා අඩු නොවන ලෙස ද කිසිදු සිසුන් දෙදෙනෙකුට සමාන පැන්සල් සංඛ්‍යාවක් නොලැබෙන ලෙස ද බෙදා දුන්නේ නම් වැඩි ම පැන්සල් සංඛ්‍යාවක් හිමි කර ගන්නා සිසුවාට ලැබෙන පැන්සල් ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

25) බටහිර දිශාවට මුහුණලා සිටින නුවන් වරකට වට කාලක් බැගින් තුන් වතාවක් වාමාවර්තව කැරකි නතර වූයේ නම් දැන් ඔහුගේ වම් අත පැත්තේ ඇති දිශාව දෙපස පිහිටි අනු දිශා දෙක කුමක් ද?

(1) ඊසාන - වයඹ (2) නිරිත - වයඹ (3) ගිනිකොන - නිරිත

26) A හා B රූප සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?





(1) A දක්ෂිණාවර්තව වට බාගයක් කැරකී B සැකසී ඇත.

(2) A වාමාවර්තව වට බාගයක් කැරකී B සැකසී ඇත.

(3) A දක්ෂිණාවර්තව වට කාලක් කැරකී සැකසී ඇත.



AnyScanner

27) 


තට්ටු කළ විට කැරකී යන පරිදි ලී පතුරු තුනක් මැදින් ඇණ දමා බිත්තියකට සවිකොට ඇති ආකාරය රූපයේ දැක්වේ. ලී පටියට පහරක් ගැසුවහොත් ඈතට විසිවන පරිදි A,B,C නම් කුඩා ප්ලාස්ටික් බෝල තුනක් ද ලී පතුරු ආසන්නයේ රඳවා ඇත. X යොදා ඇති ස්ථානයට ඊතලය ඇති දෙසින් පහරක් ගැසූ විට බෝල ඈතට විසිවෙන අනුපිළිවෙළ කුමක් ද?

(1) ACB

(2) CAB

(3) ABC

28) පහත දී ඇති වාක්‍ය නිවැරදි ව සම්පූර්ණ වීමට නම් හිස්තැන් සඳහා යෙදිය යුතු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.


'හොඳ ළමයින් ලෙස අපි .................................. හා .......................... දේ හොඳින් තේරුම්ගෙන .............................. දේ නොකරන්නටත් ...................................... දේ කරන්නටත් පුරුදු වෙමු.'

(1) නොකළ යුතු, කළ යුතු, නොකළ යුතු, කළ යුතු

(2) කළ යුතු, නොකළ යුතු, කළ යුතු, නොකළ යුතු


(3) නොකළ යුතු, කළ යුතු, කළ යුතු, නොකළ යුතු

29) රූපයේ දැක්වෙන්නේ 80 cm ක් දිග දෙකට නවන ලද තහඩු කැබැල්ලකි. එහි කඩ ඉරි ලකුණු කර ඇති ස්ථාන හතරෙන් කපා වෙන් කළ විට ලැබෙන කැබලි ගණන කීය ද?




(1) 10 (2) 9 (3) 8

30) මෙය ලී කැබැල්ලකින් කපා ගත් ඝනවස්තුවකි. මෙහි දැකිය හැකි මුළු මුහුණත් ගණන කීය ද?



(1) 4

(2) 8

(3) 6

31) පළමු වචන යුගලයට ගැළපෙන වචන යුගලය තෝරන්න.

තේ : සීනි

(1) බත් : ව්‍යාංජන


(2) මාළු : ලුණු

(3) ඇපල් : මිදි



SCAN AnyScanner

32) මුලින් දී ඇති රූපයෙන් කොටසක් ඉවත් කර ඇති අයුරු පහත දැක්වේ. එවිට ඉතුරු වන කොටස තෝරන්න.





33) අජිත් පිට්ටනියක හරි මැද සිට 100 m ක් බටහිර දිශාවට ද එතැන් සිට උතුරු දිශාවට ද හැරී 20 m ගමන් කළේ ය. දැන් අජිත් සිටින්නේ ආරම්භ කළ ස්ථානයට කුමන දිශාවෙන් ද?

(1) ඊසාන

(2) නිරිත

(2) වයඹ

34) රූපයේ දැක්වෙන්නේ කුඩා ඝනක තබා සාදාගත් විශාල ඝනකයකි. එහි අඳුරු කර ඇති ඝනක ඉවත් කළහොත් පිටතට පෙනෙන කුඩා ඝනකවල මුහුණත් හතරක් දැකගත හැකි ඝනක කීයක් තිබේ ද?



(1) 3

(2) 4

(3) 5

35) කකුල් තුනක මේසයක් හා ඒ වටා පුටු කිහිපයක් තබා ඇත. ඒ සියල්ලේ ම කකුල් ගණන 39 නම් එහි ඇති පුටු ගණන වන්නේ,

(1) 8 (2) 9 (3) 7

36) සහල් 3 kg මිල රු. 270.00 කි. කච්චි 1 kg ක මිල සහල් 1 kg මිලට වඩා රු.20 ක් අඩු ය. පරිප්පු 1 kg ක මිල සහල් 2 kg මිලෙහි එකතුවට සමාන ය.

පරිප්පු 500 g සහ කච්චි 500 g ක මිල කීය ද?

(1) රු. 90.00

(2) රු. 125.00

(3) රු. 70.00

37) දිනිති ළඟ ඇති මුදල රුපියල් 100.00 ය. ඉන් රුපියල් 8.00ක් අඩු වූ විට යමුනා ළඟ ඇති මුදලින් බාගයකට සමාන ය. යමුනා හා දිනිති ළඟ ඇති මුදල් ප්‍රමාණය අතර වෙනස කීය ද?

(1) රුපියල් 46.00

(2) රුපියල් 84.00

(3) රුපියල් 92.00



SCAN AnyScanner


38) ළමයි පස්දෙනෙක් රවුමට වාඩි වී සිටිති.

- A ගේ දෙපසින් B සහ C සිටිති.
- E ගේ දෙපසින් C සහ D සිටිති.

එසේ නම් B ගේ දෙපසින් සිටින්නේ,

(1) A - D (2) A - C (3) D - E

39) මෙම සිලින්ඩාකාර ලී කොටය කඩ ඉරි දිගේ කපා වෙන් කිරීමෙන් පසු ලැබෙන කොටස් සියල්ලේ ම ඇති මුහුණත් ගණන වන්නේ,




(1) 8

(2) 6

(3) 10

40) දී ඇති රූපය ත්‍රිකෝණයක් ලෙස සම්පූර්ණ කිරීමට එකතු කළ යුතු කොටස දී ඇති රූපයෙන්,



(1) $\frac{1}{2}$ ප්‍රමාණයකි. (2) $\frac{1}{4}$ ප්‍රමාණයකි. (3) $\frac{1}{3}$ ප්‍රමාණයකි.



SCAN AnyScanner

සියලු ම හිමිකම් ඇවිරිණි.
All Right Reserved

'බෝවිටියා මල් යාය' ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2026



## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## නිපුණතා සංවර්ධන පෙරහුරුව - අංක 03

**5 ශ්‍රේණිය**

# II පත්‍රය

කාලය පැය 1 මිනිත්තු 15

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස්**

- ❖ ඔබේ නම මෙම කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

නම :- ........................................................

- ❖ මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත.
- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ❖ පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න.
- ❖ පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන තිළිණයකි.

(01) පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.

රාත්‍රී අහස පැහැදිලි විය. තරු පිරිවරා ගත් අහසේ කොනකින් අඩ සඳක් මතු වී ආවේ ය. වැසිබර ගතිය නිසා පෙර දිනවල පැවති ඇඳිරි ගතිය මඳක් අඩු වී තිබිණි. ළා සඳ එළියට අවට ගස්වල ඡායාව යාන්තමින් පෙනේ. සුවදායක සිසිල් සුළඟක් හමා ගියේ ය. රැහැයියන්ගේ ''ක්‍රිප් ක්‍රිප්'' නාදය කන්කරච්චලයක් සේ ඇසෙන්නට විය. එදින පෙර දිනවල රාත්‍රියට වඩා අමුතු යයි සිරිල්ට සිතිණි. ඉස්තෝප්පුවේ කොට බිත්තියට හේත්තු වී අවට පරිසරය දෙස බලා සිටි සිරිල් කාගේ දෝ අඩි ශබ්දයක් ඇසී හැරී බැලුවේ ය.

''මොකද පුතා කල්පනාවෙන් වගේ, අද වැවේ පූජාව ගැනවත් කල්පනා කෙරුව ද?'' ගුණවර්ධන මහතා විමසුවේ ය.

''වැවේ පූජාව ලස්සන යි. මං කවදාවත් එහෙම එකක් දැකලා නෑ''

ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

1) පැහැදිලි ව දැකගත හැකි වූයේ කුමක් ද? ..........................................................

2) තරු පිරිවරාගත් අහසේ කොනකින් මතු වූයේ කුමක් ද? ..........................................

3) කන්කරච්චලයක් සේ ඇසෙන්නේ කාගේ හඬ ද? .......................................................

4) සෙවණැල්ල යන්නට පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද? ..........................

5) එක ම ශබ්දය දෙවරක් යෙදී ඇති වචනයක් මෙහි සඳහන් වේ. එය උපුටා ලියන්න.

..........................................................................................................

6) ''මොක ද පුතේ කල්පනාවෙන් වගේ'' මෙසේ විමසුවේ කවුද? ..........................................

(02) පහත සඳහන් එක් එක් වගන්තියේ ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1) ඔවුහු ගුවන්විදුලියට සවන් ........................................ (දුන්හ. / දුන්නේ ය.)

2) සේපාලිකා මල් බිමට .................................. (වැටෙති. / වැටෙයි.)

3) ඈ වැලිතලප මිල දී .............................. (ගනියි. / ගනිති.)

4) අධික වර්ෂාවට කඳු නාය .............................. (ගියේ ය. / ගියෝ ය.)

5) උෟ පැන් උගුරක් .............................. (බිව්වේ ය. / බිව්වෝ ය.)

(03) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

1) දරුවෝ දෙමව්පියන්ගේ අවවාද පිළිගනිති.

..........................................................................................................

2) අපි ළමා නාට්‍යයක් නරඹමු.

..........................................................................................................

(04) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදි නම් '×' ලකුණ ද හරි නම් '✓' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1) ශිෂ්ටාචාරය ( )
2) ලේඛම් ( )
3) ප්‍රතිභා ( )
4) පරිපාථය ( )



CS CamScanner

(05) පහත වගන්තියේ අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

මෙන්න බන් ඔරුව ඇතුළේ ළමයෙක්

(06) පහත වචන නිවැරදි ව ගළපා වගන්තිය නැවත ලියන්න.

සීගිරි / සුළඟ / ගල / නැංගෙමු / මුදුනට ම / සීතල / විඳිමින් / අපි

.......................................................................................................................................

(07) ස්ත්‍රී ලිංග පද ලියන්න.

1) කවියා ............................................... 2) ඔහු ...............................................

(08) පහත ඉඟි වැකියට ගැළපෙන අර්ථය ලියන්න.

මුරුංගා අත්තේ තියනවා.

.......................................................................................................................................

(09) අර්ථයට ගැළපෙන ආප්තෝපදේශය හිස්තැන මත ලියන්න.

1) ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

.......................................................................................................................................

2) ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න.

.......................................................................................................................................


(10) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

1)



| | | | | |
|---|---|---|---|---|
| | | | | |

2)



| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

(11) පහත දී ඇති වචනය නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

1) dogs / are / How / there / many

.......................................................................................................................................

2) pet / My / is / cat / a

.......................................................................................................................................

(12) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

1) Sparrow .............................. 2) Broom ..............................

(13) නූලහම් (நூலகம்) දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.......................................................................................................................................



CamScanner

(14) පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

පේළියට හිටගන්න. ..............................................................................................

(15) 1) 2 015 යන සංඛ්‍යා නාමය අකුරෙන් ලියන්න.


..............................................................................................

2) 2 635 යන සංඛ්‍යාවේ 6 ඉලක්කමේ ස්ථානීය අගය කීය ද?

..............................................................................................

(16) කූඩයක අඹ ගෙඩි 105 කි. අනෙක් කූඩයේ එමෙන් දෙගුණයට වඩා 95 ක් වැඩියෙන් ඇත. කූඩ දෙකෙහි ම ඇති අඹ ගෙඩි ගණන කීය ද? ..................................

(17) 1) මෙම රූපයේ ඇතුළත ඇති සෘජුකෝණ ගණන කීය ද? ..................................



2) මෙම රූපයේ සමමිතික රේඛාවක් ඇඳ දක්වන්න.

(18) 1) අමාලි කඩයට ගොස් ගෙන එන ලද විස්කෝතු පැකැට්ටුවෙහි සමචතුරස්‍රාකාර මුහුණත් 2 ක් හා සෘජුකෝණාස්‍රාකාර මුහුණත් 4 ක් අඩංගු විය. එය කුමන ඝනවස්තුවක් විය හැකි ද?

..................................................

2) එහි දාර ගණන හා ශීර්ෂ ගණන පිළිවෙළින් ලියන්න. ..................................................


(19) කොළඹින් පස්වරු 3.45 ට පිටත් වූ බස් රථයක් පැය 2 මිනිත්තු 30 ගමනකින් පසු ගාල්ලට ළඟා විය.

1) බස් රථය කොළඹින් පිටත් වූ වේලාව සම්මත ඔරලෝසුවෙන් ලියන්න. ..................................

2) බස් රථය ගාල්ලට ළඟා වූ වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් ලියන්න.

..............................................................................................


(20) තමර පාසලට ගෙන එන ලද කොමඩු ගෙඩියේ බර කිරන ලද ආකාරය පහත දැක්වේ. කොමඩු ගෙඩියේ බර කීය ද?




..............kg .................... g

(21) කමනිගේ කැටයේ රුපියලේ කාසි මෙන් දෙගුණයක් සත 50 හේ කාසි ද, සත පනහේ කාසි මෙන් දෙගුණයට 4 ක් වැඩියෙන් සත 25 කාසි ද ඇත. එහි සත 50 හේ කාසි 50 ක් තිබුණේ නම් කැටයේ ඇති මුළු මුදල කීය ද? ..................................

(22)




A භාජනයෙන් 4 වරක් ද B භාජනයෙන් 2 වරක් ද දමා C භාජනය පුරවන ලදී. C භාජනයෙන් ධාරිතාව කොපමණ ද? ........................................

(23) ළමයෙක් උතුරු දිශාවට මීටර 20 ක් ගොස් එතැන් සිට දකුණු අත පැත්තට හැරී මීටර 10 ක් යයි. නැවතත් ඔහු දකුණු දිශාවට මීටර 5 ක් ගොස් නවතී. දැන් ඔහු සිටින්නේ ආරම්භක ස්ථානයට කවර දිශාවෙන් ද? ....................................

(24) තෑගි ලබාදීමේ උත්සවයක දී පොත් 405 ක් එක් සිසුවෙකුට පොත් 4 බැගින් සිසුන් කී දෙනෙකුට ලබාදිය හැකි ද? .................................

(25) මෙහි ඇති මල් සංඛ්‍යාවට 4 ක් වැඩි සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.




.........................

(26) ගමනකින් $\frac{2}{5}$ ක් දුම්රියෙන් ද, $\frac{2}{5}$ බසයෙන් ද ඉතිරිය යතුරු පැදියෙන් ද ගමන් කළ කමල් යතුරු පැදියෙන් ගමන් කළ දුරින් අඩක් 4 km ක් නම් ගමනේ මුළු දුර කොපමණ ද? ...........................

(27) කමලා තේ කුඩු 2 kg 500 g කින් 250 g පැකට්ටු සාදා එක් පැකට්ටුවක් රුපියල් 130 බැගින් අලෙවි කළේ නම් ඇයට ලැබෙන මුළු මුදල කීය ද? ....................................

(28) ආපනශාලාවක විකුණු ආහාර වර්ග පිළිබඳ තොරතුරු පහත දැක්වේ. වගුව ඇසුරෙන් ප්‍රස්තාරය ද ප්‍රස්තාරය ඇසුරෙන් වගුව ද පුරවන්න.




| ආහාර වර්ගය | ප්‍රමාණය |
|---|---|
| පාන් | 10 |
| රොටි | 05 |
| ආප්ප | ................ |
| හැලප | 06 |
| බනිස් | 07 |



CS CamScanner

(29) පහත සංඛ්‍යා රටාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

1) ............... , 24 , ................... , 36 , 42

2) 3 , 9 , 27 , .............

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ දී වාදනය කරන භාණ්ඩ දෙකක් වන්නේ,
1) දෙවොල් බෙරය හා හක්ගෙඩිය 2) ගැටබෙරය හා හක්ගෙඩිය
3) ගැටබෙරය හා තාලම්පට

(31) ඌව වෙල්ලස්ස කැරැල්ල මර්දනය පිණිස ඉංග්‍රීසීන් විසින් යවන ලද්දේ,
1) ගොංගාලේ ගොඩ බණ්ඩා 2) වීර පුරන් අප්පු
3) මොනරවිල කැප්පෙටිපොළ දිසාව

(32) ගැටුම් විසඳීම සඳහා සහනශීලීව අදහස් ප්‍රකාශ කිරීමෙන් සිදුවන යහපතක් නොවේ.
1) වගකීම් පැහැර හැරීමට හුරුවේ.
2) ගැටුම් වළක්වා ගෙන කටයුතු කළ හැකි ය.
3) සමාජය තුළ යහපත් පුද්ගලයෙකු ලෙස කැපී පෙනේ.


(33) කාබනික පොහොර භාවිතා කිරීමෙන් ලැබෙන වාසියක් වන්නේ,
1) අධික මුදලක් වැය කරමින් පොහොර මිලට ගැනීමට සිදුවීම.
2) පසට අහිතකර රසායනික ද්‍රව්‍ය එකතු වීම.
3) වස විස නැති ආහාර වර්ග සපයා ගත හැකි වීම.

(34) මිනිසෙක් තම ආහාර වේල සකසා ගැනීමේ දී වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වන්නේ,
1) පිෂ්ටය අධික ආහාර ගැනීමට ය. 2) සමබල ආහාර වේලක් ගැනීමට ය.
3) තෙල් අධික ආහාර ගැනීමට ය.

(35) බඹබැඹි ගස හා යෝධ පුස්වැල පිළිවෙළින් පිහිටා ඇත්තේ,
1) මන්නාරමේ හා නුවරඑළියේ ය. 2) ඕපනායක හා කැබිලිත්තෑවේ ය.
3) මන්නාරමේ හා ඕපනායක ය.

(36) ලිපියක් තැපැල් කිරීමේ දී මුද්දරය ඇලවිය යුතු යැයි පිළිගැනෙන ස්ථානය වන්නේ,
1) ලියුමේ කවරයේ වම්පස ඉහළ කෙළවරේ
2) ලියුමේ දකුණුපස ඉහළ කෙළවරේ ය.
3) ලියුම් කවරයේ දකුණුපස ඉහළ කෙළවරේ ය.

(37) පාපැදියක ඇති රෝද දෙක දම්වැල මගින් සම්බන්ධ කර ඇති ආකාරය පහත රූපයේ දැක්වේ. එය නිරීක්ෂණය කර පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




1) විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය ද එක් වටයක් කරකැවේ.
2) පැඩලය කරකැවීමේ දී විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය වට කිහිපයක් කරකැවේ.
3) විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය වට බාගයක් කරකැවේ.

(38) සතුන්ගේ පැවැත්මට හානිකර ආකාරයේ මිනිස් ක්‍රියාකාරකමක් නොවන්නේ,
1) මිනිසාගේ විවිධ අවශ්‍යතා සඳහා කැලෑ එළි කිරීම.
2) වගාවට කාබනික පොහොර යෙදීම.
3) මිනිසාගේ විවිධ අවශ්‍යතා සඳහා ගිනි ගොඩවල් ගැසීම.



CamScanner

(39) ඉහත ඇටවුම යොදාගෙන සිදුකරන පරීක්ෂණයෙන් බලාපොරොත්තු වන්නේ,



1) වර්ෂාව පොළොවට පතිත වන විට පසෙහි සිදුවන වෙනස්කම් නිරීක්ෂණය
2) පෙරීමෙන් ජලය පිරිසිදු කරගත හැකිදැයි සොයා බැලීම.
3) ජලාශයේ පාමුල පීඩනය වැඩි බවත් ඉහළට යත්ම පීඩනය අඩු බවත් සොයා බැලීම.

(40) අස්ථි ආශ්‍රිත රෝග ඇතිවීම කෙරෙහි වඩාත් ම බලපෑමක් ඇති කරන්නේ කුමන විටමින් වර්ගය අඩු වූ විට ද?

1) විටමින් B 2) විටමින් C 3) විටමින් D

(41) අධි රක්ෂිත වනාන්තරයක් සහිත රිටිගල කන්ද පිහිටි දිස්ත්‍රික්කය තෝරන්න.
1) මාතලේ දිස්ත්‍රික්කය
2) අනුරාධපුර දිස්ත්‍රික්කය
3) පොළොන්නරු දිස්ත්‍රික්කය

(42) ''ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව ම වැජඹේවා'' මෙය රාජ්‍ය ලාංඡනයේ,
1) සමස්ත අංගවලින් පිළිබිඹු වන අදහසයි.
2) ඉර හා හඳෙන් පිළිබිඹු වන අදහසයි.
3) පුන්කළසින් පිළිබිඹු වන අදහසයි.

(43) එක් එක් පුද්ගලයා ලබා ගත යුතු ආහාර ප්‍රමාණය වෙනස්වීමට බලපාන සාධකයක් නොවන්නේ,

1) රැකියාව 2) පුරවැසිභාවය 3 වයස

(44) සරම්ප රෝගය බෝවන්නේ,
1) මීයාගෙනි.
2) අපිරිසිදු ජලය හා ආහාර ගැනීමෙනි.
3) රෝග වාහක පුද්ගලයන් මගිනි.

(45) වගාවට හානි කරන සතුන් පලවා හැරීම සඳහා අතීතයේ භාවිත කළ ක්‍රමයකි.
1) සුළං චකය එල්ලීම.
2) කෘෂි රසායනික යෙදීම.
3) ජලය හැරවීම.

(46) එස්. මහින්ද හිමියන් විසින් රචිත මුල් ම කෘතිය සහ අවසාන කෘතිය ලෙස සැලකෙන්නේ,
1) ලංකා මාතා හා නිදහසේ දැහැන
2) ඔවා මුතුදම හා මධ්‍යකාලීන සිංහල කලා
3) ඔවා මුතුදම හා ශ්‍රී පාදය

(47) හිරමනය මුවහත් කිරීම භාවිතා කෙරෙන උපකරණය වන්නේ,

1) කියත 2) පීර 3) නියන

(48) අල්පනා මෝස්තරයක් යනු,
1) බීජ අලවා කරනු ලබන නිර්මාණයකි.
2) කඩදාසි කැබලි ඉරා අලවා කරනු ලබන නිර්මාණයකි.
3) රේඛා මගින් අඳිනු ලබන නිර්මාණයකි.

(49) ජාතික උරුමයක් ආරක්ෂා කිරීම නිසා රටට සිදුවන යහපතක් වන්නේ,
1) රටට කීර්තිනාමයක් ගෙන දීම.
2) තම රටේ අනන්‍යතාවය ආරක්ෂා නොවීම.
3) රටට හානියක් සිදුවීම.



CS CamScanner

(50) බීජයක් පැළවීම සඳහා අත්‍යවශ්‍ය නොවන සාධකයකි,

1) ජලය 2) පස් 3) උෂ්ණත්වය

(51) මාර්ග සිතියමක කළු පැහැති රේඛාවලින් පෙන්වා ඇත්තේ,

1) දුම්රිය මාර්ග 2) මහා මාර්ග 3) අධිවේගී මාර්ග

(52) පිලිපීනයේ මැග්සේසේ සම්මානය හා ඉන්දීය ජනරජයේ පද්ම ශ්‍රී සම්මානයෙන් පිදුම් ලැබුවේ,

1) මාර්ටින් වික්‍රමසිංහ මහතා 2) කුමාරතුංග මුනිදාස මහතා

3) ඩබ්.ඩී. අමරදේව මහතා

(53) ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශයක බහුල ව ඇති විය හැකි ස්වභාවික උපද්‍රවයකි.

1) සුනාමිය 2) නායයෑම් 3) ගංවතුර

(54) පහත පිළිතුරු අතරින් පෙති ගණන අසමාන මල් වර්ගය වන්නේ,

1) වද මල . 2) නා මල 3) වතුසුද්ද මල

(55) ලණුවකින් ගැට ගසන ලද ලී කුට්ටියක් ඇදගෙන යෑම පහසු වන්නේ,

1) පිඟන් ගඩොල් ඇල්ලූ බිමක 2) තණකොළ සහිත බිමක

3) සිමෙන්ති බිමක

(56) සෑමවිට ම ප්‍රසන්න ප්‍රියමනාප දෙයකි.

1) කැමති දේ, තමා ළඟ ඇති දේ.

2) ලස්සන දේ, නිමාවක් නැති දේ, සෞන්දර්යාත්මක දේ.

3) ලස්සන දේ, නිමාවක් ඇති දේ, සෞන්දර්යාත්මක දේ.

(57) නරගයක් අසල පළමුවරට වැවක් ඉදිකළ රජතුමා වන්නේ,

1) පරාක්‍රමබාහු රජතුමා 2) පණ්ඩුකාභය රජතුමා

3) ධාතුසේන රජතුමා

(58) ජල වාෂ්ප උපයෝගී කර ගනිමින් සකසා ගන්නා ආහාර කාණ්ඩය වන්නේ,

1) පිට්ටු, ඉඳිආප්ප, ආප්ප 2) ලැවරිය, වණ්ඩු, හැළප 3) වණ්ඩු, ඉඳිආප්ප, තලප

(59) මුල් මගින් පැළ ලබාගත හැකි ශාකයක් නොවන්නේ,

1) බෙලි 2) කරපිංචා 3) මිරිස්

60) 'ඉරිදා දිනක අම්මාත්, තාත්තාත්, මමත්, නංගීත් මෝටර් රථයෙන් නරගයට යාමට පිටත් වුණෙමු. අපි උදෑසන 10.30 පමණ වන විට නගරයට පැමිණියෙමු. තාත්තා නගරයේ ආරක්ෂිත ස්ථානයක වාහනය නවතා අම්මාත් සමග වෙළඳසැලකට ගියහ. මමත් නංගීත් මෝටර් රථයේ සිටියෙමු. එකවර පාරදිගේ අසරණව පැමිණි ආච්චි අම්මා කෙනෙකු වාහනයේ වීදුරුවට තට්ටු කර අසරණව යමක් ඉල්ලා සිටියා ය.' එතැන් සිට සිදු වූ දේ පිළිබඳ ව අර්ථවත් වාක්‍ය 3 ක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1) ..........................................................................................

..........................................................................................

2) ..........................................................................................

..........................................................................................

3) ..........................................................................................

..........................................................................................

PAST PAPERS WIKI



CamScanner